Weekly School Department of Education,Sabaragamuwa Province/

සබරගමුව පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව-සති පාසල

ශ්‍රේණිය-10 | විෂය-නර්තනය | සතිය-අප්‍රේල් 04 සතිය

01 .**නිපුණතාව-** නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

02.**නිපුණතා මට්ටම-**. ප්‍රස්තාරකරණයේ විධි ක්‍රම අනුගමනය කරයි.

03.**විෂය සන්ධාරය/(පාඩම)-** බෙර පද හා කවි ප්‍රස්තාර කරමු

**ඉගෙනුම් පල-** 1. ප්‍රස්තාර සටහන සකස් කරගන්නා ආකාරය සහ විභාග වලට වෙන් කරගන්නා ආකාරය අවබෝධ කොට ගනිමින් ප්‍රස්තාර සටහන අඳියි.

2.කවි පද ප්‍රස්තාරයේදී කවි පද වල ඇති ලඝු, ගුරු මාත්‍රා වෙන් කොට හඳුනාගනී.

3.තිතට අදාලව තිත් ලක්ෂණ ලකුණු කරයි.

4. වන්නම්,වට්ටම්,රබන් කවි,චාමර කවි ප්‍රස්තාර කිරීමට පෙර එහි නාද මාලා හා තාල පිළිබඳ පැහැදිලි අවබෝධයකින් ලබා ඇති බව ප්‍රදර්ශනය කරයි.

5. නියමිත කවි ගායන සහ නර්තන පද ප්‍රස්තාර කිරීමේ විධි ක්‍රම අවබෝධ කොට ගනී.

6.බෙර පද කවි අවබෝධයෙන් ප්‍රස්තාර කරයි.

7. තුන් තිතේ තාල රූප නම් කරයි.

8. ප්‍රස්තාර කළ සටහන් ගුරුවරයාට යොමු කරයි.

9.ගුරුවරයා ඒ පිළිබඳව අගය කරමින් කතා කරයි.

03 .ශිෂ්‍යා කළ යුතු කාර්යයන්.-

- ❖ දුවේ පුතේ මීට පෙර වසර වලදී ඔබ ඉගෙනගත් ප්‍රස්තාර පාඩම් නැවත මතක් කර ගනිමු.අපි මුලින්ම විභාග වලට වෙන් කරමින් ප්‍රස්තාර සටහන ඇඳ ගනිමු.

- ❖ හොඳයි දුවේ පුතේ බෙර පද හා කවි පද ප්‍රස්තාර සටහනේ යෙදීමේදී ලඝු මාත්‍රා, ගුරු මාත්‍රා,ප්ලුත මාත්‍රා යොදන්නේ කෙසේද කියා බලමු.ලඝු මාත්‍රයක් සඳහා මාත්‍රා එකක්ද ගුරු මාත්‍රයක් සඳහා මාත්‍රා දෙකක්ද ප්ලුත මාත්‍රයක් සඳහා මාත්‍රා තුනක්ද හිමි බව හඳුනා ගන්න.ඒ සඳහා ඔබට 10 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත උපයෝගී කර ගත හැකිය

.

- ❖ අපි දැන් මාත්‍රා පිළිබඳ අවබෝධය ලබා ගත්තා.දැන් අපි මතක් කරගමු පළමු වාරයේ ඉගෙන ගත් “රබන් හා වන්නම් කවි ගයමින් සතුටු වෙමු” පාඩම.

- ❖ අපි එහෙනම් බෙර පද හා නිර්දේශිත කවි ලෙස රබන් කවි/චාමර කවි හා සැවුලා වන්නම ප්‍රස්තාර කරමු.

- ❖ අපි තනි තිත දෙතිත පිළිබඳ ඉගෙන ගත්ත.දැන් බලමු තුන් තිතේ අපි ඉගෙන ගන්න ඕන තාල රූපත් ඒවාට අදාල කවි හා බෙර පද මොනවාද කියල.ඔයාලට මතක ඇති කුදන්ත ගත දොං වට්ටම.ඒ සඳහා10 ශ්‍රේණියට අදාල අතිරේක කියවීම් පොත

අපිහාවිතයට ගනිමු.දැන් දරුවනේ තුන් තිතේ තාල රූපත් ඒවාට අදාල බෙර පදත් කවි පදත් ප්‍රස්තාර කරමු.

- **අපි ඉගෙනගත් පාඩම ඇසුරු කරගනිමින් පහත ක්‍රියාකාරකමේ යෙදෙන්න.**

**1.ලඝු මාත්‍රා හා ගුරු මාත්‍රා පිළිබඳ කෙටි හැඳිවීමක් කරන්න ?**

**2.සැවුලා වන්නමේ බෙර පදය කවියක් කස්තිරම සීරුමාරුව අඩව්ව ප්‍රස්තාර කරන්න ?**

**3. මාත්‍රා 4+4 ට රබන් කවියක් ප්‍රස්තාර කරන්න ?**

**4.දෙං ජිංත ගත දොංත වට්ටමේ පළමු පදයට ්දාල අඩව්ව ප්‍රස්තාර කරන්න ?**

**5.දෙසුළු මහා තුන් තිතට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න ?**

04 **දුවේ පුතේ ඔබට ඉහත ක්‍රියාකාරකම සඳහා පහතින් දක්වා ඇති පොත් පත්,web side,LMS පාඩම් හා ඉගෙනුම්**

ආධාරක උපකාර කර ගත හැකිය.-

1. e තක්සලාව- https://www.e-thaksalawa.moe.gov.lk/

2. e නැණ පියස- https://enenapiyasa.lk/

03.අතිරේක පොත් පත් සහරා- 1. 10 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත

2. නර්තනය 10 ශ්‍රේණිය-ඥානසිරි පීරිස් මහතා.

උඩරට-පහතරට-සබරගමු

**ඔබ උගත් දැනුම පිරික්සීමට පහත ක්‍රියාකාරකමේ යෙදෙන්න.**

https://wordwall.net/play/19201/040/914

සැකසුම-

නම-ආර්.ජේ.කිණිවිට. තනතුර-ශ්‍රී.ලං.ගු.සේ. 2-1 අධ්‍යාපන ආයතනය-කෑ/දෙහි/අටුළුගම මායාදුන්න ම.වි.